ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - 2010
--------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර , 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 26

------------------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ නිකුතු කොටස් ප්‍රාග්ධනයෙන 80% ක් සංස්ථාවට අයත්ව තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09

---------------------------------

(i) රු.83,111 ක් වූ බැංකු අයිරාවක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් සංචලන උපලේඛන අනුව දේපල , පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් රු.21,750,432 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.21,220,000 ක් ලෙස දක්වා තිබුණි.

(iii) රු.833,218 ක් වූ භාණ්ඩ අපහරණ ලාභය හා විකිණීමෙන් ලද මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

---------------------------------

ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව රු.2,500,000 කට ගිණුම් ගතකර රු.5,776,000 ක රක්ෂණාවරනයක් ලබාගෙන තිබූ අංක WP - HB - 5048 දරන වාහනය පූර්ණ හානියට පත්ව තිබුණි. මෙම වාහනය ඉහත පරිදි වෙළඳ පොල අගයට වඩා ඉතා අඩු අගයකට ගිණුම්ගත කර තිබූ හෙයින් රක්ෂණ වන්දි ලැබීමෙන් අනතුරුව රු.4,245,891 ක අසාමාන්‍ය ලාභයක් මූල්‍ය ප්‍රකාශන තුලින් පෙන්නුම් කෙරිණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

-----------------------------------

ඉකුත් වර්ෂ වල මූල්‍ය ප්‍රතිඵලයන්ට වන බලපෑම හෙළිදරව් කිරීමකින් තොරව පෙර වර්ෂයේ ගැලපීම් ලෙස රු.20,775,764 ක මුදලක් සමුච්චිත ලාභයෙන් කපා හැරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

අ. බැංකු ප්‍රතිමිලදී ගැනීම් වල ආයෝජනය කර තිබූ ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි සඳහා ගෙවිය යුතු රු.597,145,882 ක මුදල කෙටි කාලින ආයෝජන යටතේ දක්වනු වෙනුවට කෙටිකාලීන නොවන ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ආ. විවිධ ආයතන වෙත නොමිලයේ නිකුත් කල පිරිවැය රු.1,753,479 ක් වූ මුහුදු වැලි තොගයක් නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා එම වටිනාකමින් වැලි තොග අගය වැඩියෙන් දක්වා තිබුණි.

## 1.2.3 නොසැසදු පාලන ගිණුම්

---------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

අ) ගිණුම් අනුව සහ උප ලේඛනයන්ට අනුව ශේෂයන්හි පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය වු අතර වෙනස්කම් හඳුනාගෙන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

| අයිතමය | ගිණුමට අනුව ශේෂය | උපලේඛනයට අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| ------------ | --------- | ------------- | ---------- |
| | රු. | රු. | රු. |
| ස්ථාවර තැන්පතු | 53,731,408 | 56,515,699 | 2,784,291 |
| පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් කල ආයෝජන | 253,386,151 | 251,867,332 | 1,518,819 |

ආ) සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන අනුව නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ණය ශේෂය රු.135,443,965 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරියෙන් ලද තොරතුරු අනුව ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාවට පියවිය යුතු ණය ශේෂය රු.136,289,125ක් වුයෙන් රු.845,160 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

අ) වර්ෂය අවසානයට වු ඉදිරියට කළ ගෙවීම් වලින් රු.946,887 ක මුදලක් අවුරුදු 05 කට වඩා වැඩි කාලයක සිට පවතින නමුත් එම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) බැද්දගාන නමැති ව්‍යාපෘතිය මේ වන විටත් අවසන් වී තිබුණද වර්ෂ 5 කට අධික කාලයක් තුල ලබාගත් වැඩ පුර්ව අත්තිකාරම් මුදල වු රු.3,128,000 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

ඇ) වෙළඳ ණයගැතියන්ගේ ශේෂය තුල ඇතුලත් වර්ෂ 5 කට අධික කාලයක් ඉක්මවා තිබු රු.81,395,560 ක් වු ණය ගැති ශේෂය තුල අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

ඈ) සංස්ථාවේ මුළු වෙළඳ ණයගැති ශේෂය රු.291,539,800 ක් වු අතර එයින් රු.148,101,606 ක් එනම් මුළු ණය ගැතියන්ගෙන් 50% ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු බවත් එම මුදලින් රු.56,634,611 ක් වර්ෂ 5 ක කාලයක්ද ඉක්මවා හිඟව ඇති බවත් නිරීක්ෂණය විය.

ඉ) ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් 2010 දෙසැම්බර් 31 දිනට සංස්ථාව වෙත රු.9,964,782 ක් ලැබිය යුතු වු අතර එසේ තිබියදි සංස්ථාව අදාල සමාගම වෙත රු.2,054,249 ක අත්තිකාරමක් ලබාදි තිබුණි.

ඊ) රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සේවාවන් සඳහා ලැබිය යුතු රු.155,200,000ක මුදලක් අයකර ගෙන නොමැති අතර වැඩ නිමවු මෙම ව්‍යාපෘති අතරින් ඇතැම් ව්‍යාපෘති සඳහා අත්තිකාරම් හෝ ලබා නොගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි.

උ) දිගු කාලයක් තිස්සේ නිරවුල් නොවු රු.68,208,560 ක මුදලක් ජංගම වගකීම් යටතේ උපචිත වියදම් ලෙස දක්වා තිබුණි. මෙම වියදමින් රු.65,984,338 ක ප්‍රමාණයක් බදු වශයෙන් රජයට ගෙවිය යුතු බව නිරීකෂණය විය. විස්තර පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 15,178,378 |
| ගෙවිය යුතු ලාභාංශ | 2,224,222 |
| භාණ්ඩ හා සේවා බද්ද | 269,412 |
| ව්‍යාපාරික පිරිවැටුම් බද්ද | 17,972,468 |
| පලාත් පාලන ආයතන සඳහා වු ගොඩකිරීමේ බද්ද | 32,000,000 |
| රජයට ගෙවිය යුතු බද්ද | 564,080 |
| එකතුව | 68,208,560 |

## 1.2.5 නීති , රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් වාහනයක් සඳහා වු සියලු නඩත්තු වියදම් ආයතනය විසින් දරා තිබුණද එය 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.9 වගන්තියට පටහැනිව ආයතනයේ කටයුතු වලට පරබාහිර කාර්යයන් සඳහාද යොදවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු අයකිරීමට පෙර රු.135,580,563 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.295,932,406 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.160,351,843 ක පිරිහිමක් පෙන්නුම් කෙරේ. මෙහෙයුම් හා මෙහෙයුම් නොවන ආදායම් අඩුවීම හා පරිපාලන හා පොදු වියදම් මෙන්ම අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය පිරිහිමට බලපා තිබුණි.

#### 2.1.2 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

2010 දෙසැම්බර් 31 දිනට මුළු තොගය (වැලි තොගය හැර) රු.85,156,998 ක් වු අතර ඉන් රු.44,379,439 ක් සෙමෙන් චලනය වන තොග වේ . එය මුළු තොගයේ වටිනාකමින් 52% කි. තවද සෙමෙන් චලනය වන තොගය තුල අවුරුදු 5 ට වැඩි කාලයක් ගබඩා තුල තිබු රු. 37,739,607 තොගයක්ද ඇතුලත් අතර එම අගය සෙමෙන් චලනය වන තොග අගයෙන් 85% ක් ලෙස නිරීක්ෂණය විය. එමෙන්ම මුළු තොග වටිනාකමින් සෙමින් චලනය වන තොග සඳහා රු.42,770,981 ක් වෙන්කිරීම් වශයෙන් අඩුකර දකවා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

#### 2.2.1 භෞතික කාර්ය සාධනය

----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

අ. සංස්ථාව විසින් 2010 වර්ෂය සඳහා පිළියෙල කල ක්‍රියාකාර සැලැස්මෙහි වර්ෂයට අදාලව කල යුතු කාර්යයන් නිශ්චිතව හඳුනාගෙන නොතිබීම නිසා 2010 ප්‍රගති වාර්තා සමඟ වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම නිශ්චිතව සැසඳිම අසීරු අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

ආ. සමාලෝචිත වර්ෂයේදි කැණීම් ව්‍යාපෘති දෙකකින්ද, ඉදිකිරීම් ව්‍යාපෘති පහකින්ද , අපවහන ව්‍යාපෘති තුනකින් හා වෙනත් ව්‍යාපෘති වලින් සංස්ථාව රු.44,826,964 ක අලාභයක් දරා තිබුණි. නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති බව විගණනයේදි නිරීක්ෂණය විය.
තවද ලාභ ගණනයේදි එකිනෙක ව්‍යාපෘතියට අදාලව පොදු කාර්ය පිරිවැය ගැලපීමක් කර නොමැති අතර එලෙස ගණනය කල විට මෙම අලාභය තව දුරටත් වර්ධනය වනු ඇත.

ඇ. ලුනාව පරිසර ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන ප්‍රධාන ඇල මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා රු. 216,630,221 ක යන්ත්‍ර හා උපකරණ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ලබාදි තිබුණද අදාල නඩත්තු කටයුතු නිසි පරිදි ඉටුකර නොතිබීම හේතුවෙන් ප්‍රධාන ඇල මාර්ග අවහිර වී ජලය බැස නොයන තත්වයක් උද්ගත වී තිබුණි. එමෙන්ම අදාල යන්ත්‍ර උපකරණ ව්‍යාපෘතියෙන් බැහැර වෙනත් කටයුතු සඳහා යොදවාගෙන තිබු අවස්ථාවන්ද නිරීක්ෂණය විය.

## 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පවරාගත් ඉඩම් අත්පත් කර ගැනීමේදි සැලකිය යුතු කාල පමාවක් සිදු වී තිබිම හේතුවෙන් ඒ සඳහා පොලී වශයෙන් රු. 243,620,863කට ආසන්න මුදලක් බාහිර පාර්ශයවන් වෙත ගෙවීමට සිදුවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

## 2.2.3. ආර්ථික නොවු ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාවට අයත් වාහන සඳහා ප්‍රධාන කාර්යාලයට ආසන්නයේ පිහිටි ඉන්ධන පිරවුම් හලකින් ඉන්ධන ලබා නොගෙන නාවල පිහිටි ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබාගැනීම හේතුවෙන් කිලෝ මීටරයක් සඳහා වැයවන සාමාන්‍ය පිරිවැය අනුව ගණනය කල විට 2010 වර්ෂයේ ඉන්ධන ලබාගැනීම සඳහා වු අමතර ප්‍රවාහන පිරිවැය ලෙස රු.623,160 ක් වැයකර තිබුණි.

(ආ) 1996 වර්ෂයේ සිට ලංකා මැෂින් ලීසස් සමාගමේ රු.1,100,000 ක් ආයෝජනය කර තිබු අතර ආයෝජනය කරන ලද මුළු මුදල සඳහාම වටිනාකම අඩුවීම වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා තිබුණ. තවද ආයෝජන දින සිට මේ දක්වා කිසිදු ආයෝජන ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබි නොතිබුණි.

(ඇ) 1998 දී සීමාසහිත රිල් එස්ටේට් පෞද්ගලික සමාගමේ රු. මිලියන 2 ක් ආයෝජනය කර තිබූ අතර ඒ සඳහා සංස්ථාවට කිසිදු දිනෙක ලාභාංශ ලැබී නොතිබුණි. මේ අවස්ථාව වන විට මෙම සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සංස්ථාව විසින් රු.මිලියන 30.11 ක වියදමක් දරා ක්‍රියාත්මක කල පහත සඳහන් ව්‍යාපෘති අතරමග නවතා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම මුදල් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| | (රු.මිලියන) |
| එඬේරමුල්ල නගර සංවර්ධනය | 21.14 |
| බේරේ ඇල හැරීම | 8.97 |
| එකතුව | 30.11 |

බේරේ ඇල හැරීම සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍යමය අරමුදල් සැපයීම වරාය අධිකාරියෙන් සිදුවී තිබූ අතර, ඇල හැරීමේදී පස් ඉවත් කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් සංස්ථාව සතුව නොවීමෙන් ඇල හැරීමේ කටයුතු 2009 වර්ෂයේ සිට ඇනහිට ඇති බවද නිරීක්ෂණය විය.

(ඉ) මිනුවන්ගොඩ හා කිරිබත්ගොඩ ව්‍යාපෘතිවල පිරිවැය පිලිවෙලින් රු.8,814,388 ක් හා රු.12,506,116 ක් සමාලෝචිත වර්ෂය තුලදී ලියා හැර තිබුනි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වාහන උපයෝජනය
(ආ) ආදායම් ගිණුම් ගත කිරීම
(ඇ) ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම
(ඈ) ගනුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම